© ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

ඉතිහාසය II (II කොටස)
வரலாறு II (பகுதி II)
History II (Part II)

25-B S II

යුරෝපා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1989 දක්වා

උපදෙස්:
※ **පළමුවැනි** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවැනි** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.** ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

(i) සාර්ඩිනියා (ii) ටයිබර් ගඟ (iii) ඇඩ්‍රියාතික් මුහුද
(iv) ඩාඩනල්ස් සමුද්‍ර සන්ධිය (v) ලිස්බන් (vi) පෝලන්තය
(vii) මැන්චෙස්ටර් (viii) කීල් ඇල

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි; කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි)*

2. පහත දැක්වෙන ක්ෂේත්‍රවල පුරාණ රෝමවරුන්ගේ කාර්යසංසිද්ධිය සැකෙවින් පරීක්ෂා කරන්න.
(i) ආණ්ඩුක්‍රම
(ii) නීතිය (ලකුණු 14යි)

3. (i) සමාජ හා ආර්ථික ක්‍රමයක් වශයෙන් යුරෝපයේ වැඩවසම් ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 08යි)
(ii) මධ්‍යතන යුගයේ අවසාන සමයේ යුරෝපයේ වැඩවසම් ක්‍රමය පරිහානියට පත් වූ අයුරු ගෙනහැර දක්වන්න. (ලකුණු 06යි)

4. "දේශ ගවේෂණ, යුරෝපයේ දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රවල අතිවිශාල පරිවර්තනයක් ඇති කළේ ය."
(i) මුල්කාලීන දේශ ගවේෂණවල නිරත වූ **එක්** අයිබීරියානු රටක් නම් කරන්න. (ලකුණු 01යි)
(ii) දේශ ගවේෂණවලට අනුග්‍රහය දැක්වූ පාලකයන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02යි)
(iii) **එක්** යුරෝපීය රටක් නිරත වූ දේශ ගවේෂණ පිළිබඳ ලුහුඬු විස්තරයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 03යි)
(iv) දේශ ගවේෂණ, යුරෝපයේ අතිවිශාල දේශපාලන හා ආර්ථික වෙනස්වීම් ඇති කළ අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 08යි)

5. "ප්‍රංශ විප්ලවය මධ්‍යම පන්තිය විසින් ආරම්භ කරන ලදී."
(i) විප්ලවය ඇති වන විට ප්‍රංශය පාලනය කරමින් සිටි පාලකයා නම් කරන්න. (ලකුණු 01යි)
(ii) පූර්ව විප්ලවීය ප්‍රංශයේ පැවති ප්‍රජා ගණ **තුන** නම් කරන්න. (ලකුණු 03යි)
(iii) පූර්ව විප්ලවීය ප්‍රංශයේ ජීවත් වූ දාර්ශනිකයන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02යි)
(iv) මධ්‍යම පාන්තිකයන්ගේ දුක්ගැනවිලි කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රංශ විප්ලවය ආරම්භ කිරීමෙහිලා මධ්‍යම පන්තිය විසින් ඉටු කරන ලද භූමිකාවේ සාපේක්ෂ වැදගත්කම විවේචනාත්මකව විමසන්න. (ලකුණු 08යි)

6. (i) වියනා සම්මේලනය විසින් විසඳිය යුතුව තිබූ ප්‍රධාන ගැටලු කවරේ ද? (ලකුණු 05යි)
(ii) එම ගැටලු විසඳීමට වියනා සම්මේලනය විසින් ගනු ලැබූ පියවර විස්තර කරන්න. (ලකුණු 09යි)

7. ඉතාලි එක්සත් ව්‍යාපාරයෙහිලා මැසිනි, කැවූර් හා ගැරිබෝල්ඩි යන නායකයන් ඉටු කළ කාර්යභාරයන් පරීක්ෂා කරන්න. (ලකුණු 14යි)

[හත්වැනි පිටුව බලන්න.

Scanned by CamScanner

8. "ජාතීන්ගේ සංගමය අසාර්ථක වීම දෙවන ලෝක යුද්ධය ඇති වීමට මග පෑදී ය."

(i) ජාතීන්ගේ සංගමය පිහිටුවීමට යෝජනා කළ නායකයා නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) ජාතීන්ගේ සංගමයේ ප්‍රධාන අරමුණු කවරේ ද? (ලකුණු 03 යි)

(iii) ජාතීන්ගේ සංගමය අසාර්ථක වූයේ මන් ද? (ලකුණු 03 යි)

(iv) ජාතීන්ගේ සංගමය අසාර්ථක වීම දෙවන ලෝක යුද්ධය ඇති වීමට කෙතෙක් දුරට හේතු වී ඇයි පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි)

9. **එක්කෝ** (A) කොටසට **නැතහොත්** (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.

(A) (i) 'නිරවි යුද්ධය' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 06 යි)

(ii) නිරවි යුද්ධය යුරෝපයේ දේශපාලනය කෙරෙහි බලපෑවේ කෙසේ ද? (ලකුණු 08 යි)

(B) පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) පුරාණ ග්‍රීක කලාව හා සාහිත්‍යය

(ii) පුනරුද සමයේ කලාව

(iii) ප්‍රති රෙපරමාදුව

(iv) අමෙරිකානු විප්ලවයේ පසුබිම

(v) බිස්මාක් සහ ජර්මන් ජාතිකවාදය

(vi) බොල්ෂෙවික් විප්ලවය

(එක් සටහනකට ලකුණු **07** බැගින්)

* * *

Scanned by CamScanner